කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

*දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය*

**වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය**

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි පළමු පරීක්ෂණය (බාහිර) - 2014

මාර්තු - 2019

**BMGT E 1025 – ව්‍යාපාර ගිණුම්කරණය**

කාලය : පැය 03 යි

**සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

උපදෙස්

i. I හා II කොටස් වල සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය. I වන කොටසට ලකුණු 35 ක් හිමිවන අතර II කොටසට ලකුණු 65 ක් හිමි වේ.

ii. ප්‍රශ්න පත්‍රයේ I වන කොටසට අදාල ප්‍රශ්නවලට පිළිතුරු අනිවාර්යයෙන්ම ප්‍රශ්න පත්‍රයෙහිම සඳහන් කළ යුතු අතර, එය පිළිතුරු පොතෙහි ඇමිණිය යුතුයි.

iii. II කොටස සඳහා පිළිතුරු සැපයීමට පිළිතුරු පොත භාවිතා කරන්න.

iv. ගනක යන්ත්‍ර භාවිතා කල හැකිය.

## I කොටස

**ප්‍රශ්න අංක 1 - 10 දක්වා වඩාත්ම යෝග්‍ය පිළිතුර යටින් ඉරක් අඳින්න.**

1) පහත පුද්ගලයින් අතුරින් මූල්‍ය ප්‍රකාශණයක අභ්‍යන්තර පරිශීලකයකු වන්නේ කවුරුන්ද?

අ) ව්‍යාපාරයේ ණයහිමියෙක්

ආ) රජයේ නියෝජිත ආයතනයක්

ඇ) ව්‍යාපාරයේ කොටස්කරුවකු

ඉ) ව්‍යාපාරයේ කළමනාකරුවකු

2) පහත ප්‍රකාශන අතුරින්, ABC තොග පාලන ක්‍රමයට අනුව ගබඩාවේ තබා ගතයුතු එක් එක් තොග අයිතමයන්ගේ වාර්ෂික රුපියල් අගය නිවැරදිව සඳහන් වන්නේ,

අ ) A අයිතම - වාර්ෂික රුපියල් අගය 70% - 80% , B අයිතම -වාර්ෂික රුපියල් අගය 05% - 25% , C අයිතම - වාර්ෂික රුපියල් අගය 05% - 15%

ආ ) A අයිතම - වාර්ෂික රුපියල් අගය 60% - 70% , B අයිතම -වාර්ෂික රුපියල් අගය 15% - 30% , C අයිතම - වාර්ෂික රුපියල් අගය 10% - 15%

ඇ ) A අයිතම - වාර්ෂික රුපියල් අගය 15% - 20% , B අයිතම -වාර්ෂික රුපියල් අගය 35% - 50% , C අයිතම - වාර්ෂික රුපියල් අගය 30% - 50%

ඉ ) ඉහත ප්‍රකාශනයන්ගෙන් කිසිවක් නිවැරදි නොවේ.

3) පහත ඒවායෙන් ජංගම අනුපාතය වැඩිවීමට බලපානු නොලබන්නේ කුමක්ද?

අ) අමතර ස්ථාවර වත්කම් මූල්‍යනය සඳහා කෙටිකාලීන ණය ලබාගැනීම

ආ) තොග මිලදී ගැනීම සඳහා දිගුකාලීන ණය ප්‍රාග්ධනය නිකුත්කිරීම

ඇ) ජංගම වගකීම් නිදහස් කිරීම සඳහා සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය නිකුත්කිරීම

ඉ) වෙළඳ ණය හිමියන්ට ගෙවීම සඳහා ස්ථාවර වත්කම් විකිණීම

4) සෑම විකුණුම් ගණුදෙනුවකදීම විකුණුම් පිරිවැය ගණනය කිරීම හා වාර්තා කිරීම සිදුවන්නේ,

අ) කාලච්ඡේද තොග පද්ධතියක දී පමණි.

ආ) අනවරත තොග පද්ධතියක දී පමණි.

ඇ) කාලච්ඡේද හා අනවරත යන තොග පද්ධති දෙකෙහිදීම ය.

ඈ) මෙම කාලච්ඡේද හා අනවරත යන තොග පද්ධති දෙකෙහි නොවේ.

5) ගිණුම් ප්‍රමිත අනුව තොග නිර්වචනයට නොගැනෙන්නේ පහත ඒවා අතුරින් කවරක් ද ?

අ) කාර්යාල බඩු විකුණන ස්ථානයක ඇති ඡායා පිටපත් කොල

ආ) විදුලි උපකරණ සාප්පුවක ඇති කැසට් ධාවක උපකරණයක්

ඇ) ප්ලාස්ටික් කම්හලක මානව සම්පත් අංශයේ භාවිතා කර ඉවත දමන කාර්යාල බඩු තොග

ඈ) ඉහත සියල්ලම තොග නිර්වචනයට අයත් වේ.

6) ව්‍යාපාරයක් අඩමාණ ණය සඳහා වෙන් කිරීම් අඩු කළ හොත්, පහත ඒවා අතරින් ශුද්ධ ආදායමට ඇති කරන බලපෑම වන්නේ,

අ) එමගින් ශුද්ධ ආදායම ඉහළ දැමීමය.

ආ) එමගින් ශුද්ධ ආදායම පහළ දැමීමය.

ඇ) එමගින් බලපෑමක් නොමැතිවීමය.

ඉ) එමගින් දළ ලාභය සහ ශුද්ධ ආදායම ඉහළ දැමීමය.

7) මාස තුනක කාලයක් සඳහා නිෂ්පාදනයකට ඇති ඉල්ලුම ඒකක 12, 500 ක් වේ. නිෂ්පාදන ඒකකයක් සඳහා මිලදීගැනීමේ පිරිවැය රු. 15/= ක් හා එක් ඇනවුමක් සඳහා ඇනවුම් පිරිවැය රු. 20/= ක් වේ. වාර්ෂික රඳවාගැනීමේ පිරිවැය එහි මිලදීගැනීමේ පිරිවැයෙන් 10% කි. ඒ අනුව ආර්ථික ඇනවුම් ප්‍රමාණය කොපමණද (ආසන්න ඒකකයට)?

අ) 1,577

ආ) 1,816

ඇ) 1,866

ඉ) 1,155

8) පහත ඒවායෙන් ජංගම අනුපාතය වැඩිවීමට බලපානු නොලබන්නේ කුමක්ද?

අ) අමතර ස්ථාවර වත්කම් මූල්‍යනය සඳහා කෙටිකාලීන ණය ලබාගැනීම

ආ) තොග මිලදී ගැනීම සඳහා දිගුකාලීන ණය ප්‍රාග්ධනය නිකුත්කිරීම

ඇ) ජංගම වගකීම් නිදහස් කිරීම සඳහා සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය නිකුත්කිරීම

ඉ) වෙළඳ ණය හිමියන්ට ගෙවීම සඳහා ස්ථාවර වත්කම් විකිණීම

9) Hulk PLC විසින් Bulk PLC හි සාමාන්‍ය කොටස් 55% ක් මිලදී ගන්නා ලදී. Hulk PLC විසින් Vindie PLC හි සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයෙන් 10% ක් ගන්නා ලද අතර Bulk PLC විසින් Vindie PLC හි සාමාන්‍ය කොටස් 60% ක් මිලට ගන්නා ලදී. Vindie PLC යනු Hulk PLC හි .......................... කි.

අ) පරිපාලිත සමාගම

ආ) මව් සමාගම

ඇ) ආශ්‍රිත සමාගම

ඉ) ඉහත කිසිවක් නොවේ.

10) හවුල්කරුවකු විසින් හවුල් ව්‍යාපාරය තුල මුදල් නොවන වත්කමක් ආයෝජනය කරන විට, එම වත්කම් වාර්තා කළ යුත්තේ ,

අ) පොත් අගයට ය .

ආ) ඉදිරියට ගෙන ආ යුතු අගයට ය.

ඇ) සාධාරණ වෙළඳපොල අගයට ය.

ඈ) නියමාකාර පිරිවැයට ය.

(ලකුණු 2 x 10 = 20)

**ප්‍රශ්න අංක 11 - 15 දක්වා පිළිතුර සපයා දී ඇති හිස්තැනෙහි ලියන්න.**

11) A සහ B යන හවුල් ව්‍යාපාරයේ සාරාංශගත ශේෂපත්‍රය පහත පරිදි වේ.

| | රු. | | රු. |
|---|---|---|---|
| කීර්තිනාමය | 12,000 | ප්‍රාග්ධන ගිණුම්. | |
| ශුද්ධ වත්කම් | 28,800 | හවුල්කරු A | 24,000 |
| | | හවුල්කරු B | 16,800 |
| | 40,800 | | 40,800 |

A සහ B ලාභ බෙදාගත් අනුපාතය වූයේ 2:1 වශයෙනි. නමුත් ඔවුන් ලාභ අනුපාතය 3:2 වශයෙන් වෙනස්කිරීමට එකඟ විය. මෙහිදී කීර්තිනාමය රු. 30,000/= ක් වශයෙන් ප්‍රත්‍යාගණය කොට ශේෂ පත්‍රයේ දක්වන ලදී. මෙයට අනුව A ගේ ප්‍රාග්ධන ගිණුමේ ශුද්ධ ශේෂය කීයද?

-----------------------------------------------------------------

-----------------------------------------------------------------

-----------------------------------------------------------------

-----------------------------------------------------------------

-----------------------------------------------------------------

(ලකුණු 02)

12) සමාගමක් රුපියල් මිලියන 180 ක් ගෙවා තනිපුද්ගල ව්‍යාපාරයක් මිලට ගන්නා ලදී. තනි පුද්ගල ව්‍යාපාරයේ වත්කම් හා වගකීම් පහත පරිදි අගය කරනු ලැබීය.

| | රු. 000 |
|---|---|
| ස්ථාවර වත්කම් | 70,000 |
| ජංගම වත්කම් | 30,000 |
| ජංගම වගකීම් | 5,000 |
| දිගුකාලීන ණය | 10,000 |

සමාගම කීර්තිනාමය සඳහා කල ගෙවීම කීයද?

---

---

---

---

---

(ලකුණු 03)

13) එක්තරා සමාගමක් නිෂ්පාදන පිරිවැයට 25% ක් කර්මාන්තශාලා ලාභය ලෙස එකතු කරයි. නිෂ්පාදන ආයතනයක් සම්බන්ධ පහත තොරතුරු සපයා ඇත.

| | රු. |
|---|---|
| නිමි භාණ්ඩ 2017 අප්‍රේල් 01 දිනට | 30,000 |
| නිෂ්පාදන පිරිවැය (නිෂ්පාදන ගිණුමට අනුව 2018 මාර්තු 31 දිනට) | 300,000 |
| අවසන් නිමි භාණ්ඩ (වෙළෙඳ ගිණුමට අනුව 2018 මාර්තු 31 දිනට) | 60,000 |

ඉහත තොරතුරුවලට අනුව කර්මාන්ත ශාලා ලාභය වශයෙන් 2018 මාර්තු 31 දිනෙන් අවසන් වසරට පිළියෙල කරන ලාභාලාභ ගිණුමට බැරකල යුතු වන්නේ,

---

---

---

---

---

(ලකුණු 03)

14) ව්‍යාපාරයක් සිය ආදායම් ප්‍රකාශනයේ මුහුණතෙහි අනිවාර්යයෙන්ම අන්තර්ගත කල යුතු තොරතුරු වන්නේ;

i. අයභාරය
ii. ......................................
iii. ......................................
iv. ......................................

(ලකුණු 02)

15) ශ්‍රී ලංකා ප්‍රමිත අංක 1 අනුව මූල්‍ය ප්‍රකාශනයක අන්තර්ගත විය යුතු ***පොදු ලක්ෂණයන්*** පහක් (05) නම් කරන්න.

i. ..........................................................................................................................................

ii. ..........................................................................................................................................

iii. ..........................................................................................................................................

iv. ..........................................................................................................................................

v. ..........................................................................................................................................

(ලකුණු 05)

(I කොටස - මුළු ලකුණු 35)

## II කොටස

**ප්‍රශ්න අංක 01**

(අ) මොගැම්බෝ සමාගමේ ගිණුම් සහයක විසින් 2018 මාර්තු 31 වනදිනට සකසන ලද ශේෂ පිරික්සුම තුලනය නොවුනි. එම වෙනස අවිනිශ්චිත ගිණුමකට මාරු කරන ලද අතර මූල්‍ය ප්‍රකාශණ කෙටුම්පත් කිරීම අරඹන ලදී. 2018 මාර්තු 31 දිනයෙන් අවසන් වසර සඳහා කෙටුම්පත් කළ මූල්‍ය ප්‍රකාශණවල රු. 748,000 ක ලාභයක් දක ගත හැකි විය.

පහත ගිණුම් වැරදි පසුව හඳුනාගනු ලැබිය.

- ❖ රු. 33,000 ක ණයට විකුණුම් ගිණුමේ සහ ණය ගැති ගිණුම්වල දෙවතාවක් සටහන් වී ඇත.
- ❖ රු. 350,000 ට මිලට ගත් ලැප්ටොප් පරිගණක යන්ත්‍රයක පිරිවැය පරිගණක අළුත්වැඩියා ගිණුමකට චාර්තා වී ඇත. නමුත්, එය මුදල් පොතේ නිවැරදිව වාර්තා වී ඇත.
- ❖ ණය හිමියකුගෙන් ලබාගත් රු. 600,000 ක ණයට ගැණුම් මුළුමනින්ම පොත්වලින් මගහැරී ඇත.
- ❖ රු. 50,000 ක කුලී වියදම රු. 5,000 ක් ලෙස කුලී වියදම් ගිණුමට හර කර ඇති අතර, මුදල් පොතෙහි එය නිවැරදිව සටහන් ගත කර ඇත.
- ❖ ලිපි ලේඛණ වියදම රු. 25,000 ක් වූ අතර එය රු. 52,000 ක් ලෙස එම ගිණුමෙහි සඳහන් වී ඇත. එහි අනෙකුත් සටහන නිවැරදිව මුදල් පොතට ගෙන ගොස් ඇත. තවද, සමන් නැමැති ණය හිමියාට ගෙවන ලද රු. 355,000 ක මුදල රු. 553,000 ක් ලෙස ණය හිමියාගේ ගිණුමෙ සඳහන් වී ඇත. මෙහි ද අනෙක් සටහන මුදල් පොතට රැගෙන ගොස් ඇත.

අවශ්‍ය වන්නේ,

ඉහත වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය කරන ජර්නල් සටහන් සකසන්න.

(ලකුණු 05)

(ආ) AXZ සාංගමික ව්‍යාපාරයේ රථ වාහන සම්බන්ධිත තොරතුරු පහත පරිදි වේ.

- ආයතනයේ ප්‍රතිපත්තිය වන්නේ රථවාහන පිරිවැය මත 25% ක් වාර්ෂිකව සරල මාර්ග ක්‍රමයට ක්ෂය කිරීම යි.
- 2016 ජූලි 01 රු. 3,200,000/= ක පිරිවැයට මිලදී ගත් වෑන් රථයක් 2017 ජූලි 01 දින රු. 2,000,000/= මුදලකට විකුණන ලදී.
- 2017 ඔක්තෝම්බර් 01 දින නවතම ප්‍රවාහන ට්‍රක් රථයක් රු. 4,500,000/= කට මිලදී ගන්නා ලදී.
- ආයතනය තුල වෙනත් මෝටර් රථ නොමැති බවට උපකල්පනය කරන්න.

අවශ්‍ය වන්නේ,

2018 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා පහත ගණනයන් සිදු කරන්න.

i) මෝටර් රථ විකිණීමෙන් ලද ලාභය/ අලාභය (ලකුණු 03)

ii) මෝටර් රථ සඳහා වසරේ ක්ෂය වියදම.

(ලකුණු 02)

(ඇ) සුදේශ් සහ අනු විසින් ලාභ අලාභ පිළිවෙලින් 3:1 අනුපාතයට බෙදාගනිමින් 'සූනු' නමින් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබයි. 2017 අප්‍රේල් 01 දින ඔවුහු පහත කොන්දේසි මත ධර්මදාස හවුල්කරුවකු ලෙස බඳවා ගැනීමට එකග වූ අතර, එතැන් සිට SAD හවුල්කරුවන් ලෙස හවුල් ව්‍යාපාරයේ නාමය වෙනස්කර පවත්වාගෙන යාමටද එකග විය.

- නව හවුල් ව්‍යාපාරයේ ලාභාලාභ අනුපාතය සුදේශ්, අනු සහ ධර්මදාස අතර පිළිවෙලින් 5:3:2 ලෙස වෙනස් විය.
- ආරම්භක ප්‍රාග්ධන ශේෂ මත 12% ක වාර්ෂික පොලියක් ගෙවනු ඇත.
- සුදේශ් වෙත මාසිකව රු. 30,000 ක වේතනයක් ගෙවනු ඇත.

2018 මාර්තු 31 වන දිනට හවුල් ව්‍යාපාරයේ ශේෂ පිරික්සුම තුලින් පහත ශේෂයන් උපුටා ගන්නා ලදී.

| | හර (රු.'000) | බැර (රු.'000) |
|---|---|---|
| **ප්‍රාග්ධන ගිණුම් ශේෂය** | | |
| (2017 අප්‍රේල් 01 දිනට) | | |
| සුදේශ් | | 8,000 |
| අනු | | 4,000 |
| ධර්මදාස | | 6,000 |
| **ජංගම ගිණුම් ශේෂ (1 අප්‍රේල් 2017** | | |
| සුදේශ් | | 1,000 |
| අනු | 400 | |
| ධර්මදාස | | |
| **වර්ෂය තුල ගැනිලි** | | |
| සුදේශ් | 300 | |
| අනු | 200 | |
| ධර්මදාස | 100 | |

හවුල් ව්‍යාපාරයේ 2018 මාර්තු 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජනයට පෙර ශුද්ධ ලාභය රු. 3,000,000/= ක් විය.

අවශ්‍ය වන්නේ,

2018 මාර්තු 31 න් අවසන් වසර සඳහා SAD හවුල් ව්‍යාපාරයේ,

i) ලාභාලාභ විසර්ජන ගිණුම

(ලකුණු 04)

ii) හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් සකස් කරන්න. (ලකුණු 06)

**(මුළු ලකුණු 20)**

<u>ප්‍රශ්න අංක 02</u>

"සංස්ථාපිතයන් (Corporates) සාපේක්ෂව තිරසාර වේ."

අ) සංස්ථාපිත වර්ග ලැයිස්තුගත කර කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 04)

ආ) සංස්ථාපිතවල වාසි සහ අවාසි මොනවාද?

(ලකුණු 02)

ඇ) සමූහ සමාගම් යන්නෙන් අදහස් වන්නේ කුමක්ද යන්න පහදා, සමූහ සමාගමක් බිහිවන ආකාරය පහදන්න.

(ලකුණු 02)

ඉ) 2018 මාර්තු 31 දිනට අමුණුගම පොදු සමාගමේ ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | හර (රු. 000) | බැර (රු. 000) |
|---|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | | |
| සාමාන්‍ය කොටස් | | 28,000 |
| වරණීය කොටස් | | 6,200 |
| 17.5% ණයකර | | 5,200 |
| පොදු සංචිතය | | 250 |
| රඳවාගත් ලාභ 2017/04/01 | | 920 |
| **දේපොල, පිරියත සහ උපකරණ - පිරිවැයට** | | |
| ඉඩම් | 35,000 | |
| ගොඩනැගිලි | 8,400 | |
| ගොඩනැගිලි (නොනිමි) | 2,200 | |
| මෝටර් රථ | 2,350 | |

| | | |
|---|---|---|
| කාර්යාල උපකරණ | 2,100 | |
| ගෘහභාණ්ඩ හා සවිකිරීම් | 1,650 | |
| **2017/04/01 දිනට ක්ෂය සඳහා වෙන් කිරීම්** | | |
| ගොඩනැගිලි | | 1,900 |
| මෝටර් රථ | | 1,410 |
| කාර්යාල උපකරණ | | 945 |
| ගෘහ භාණ්ඩ හා සවිකිරීම් | | 660 |
| වෙළඳාමේ ලැබිය යුතු/ ගෙවිය යුතු ගිණුම් | 8,550 | 9,200 |
| 2018/04/01 දිනට තොගය | 10,500 | |
| උපචිත වියදම් | | 650 |
| බැංකු ණය | | 3,200 |
| මුදල් සහ ආසන්න මුදල් | 3,500 | |
| විකුණුම් පිරිවැය සහ විකුණුම් | 63,700 | 98,000 |
| අනෙකුත් ආදායම් | | 1,565 |
| පරිපාලන වැය | 7,990 | |
| බෙදාහැරීමේ වැය | 7,700 | |
| අනෙකුත් වැය | 3,600 | |
| මූල්‍ය වැය | 510 | |
| බදු ගෙවීම | 350 | |
| | 158,100 | 158,100 |

පහත අමතර තොරතුරු ලබා දී ඇත.

(1) 2017/12/31 වන දින සමාගම රථ වාහනයක් රු. 350,000 කට විකුණූ අතර එය 2015-01-01 දින රු. 800,000 කට මිලදී ගන්නා ලද එකකි. මෙම සටහන් පොත්වල වාර්තා කර නොමැත.

(2) ක්ෂය අනුපාත පහත පරිදි වේ.

- ගොඩනැගිලි - වාර්ෂිකව 5% (සරල මාර්ග ක්ෂය ක්‍රමය)
- රථ වාහන - වාර්ෂිකව 15% (සරල මාර්ග ක්ෂය ක්‍රමය)
- කාර්යාල උපකරණ - වාර්ෂිකව 15% (සරල මාර්ග ක්ෂය ක්‍රමය)
- ගෘහභාණ්ඩ සහ සවිකිරීම් - වාර්ෂිකව 20% (සරල මාර්ග ක්ෂය ක්‍රමය)

(3) ණයකර පොළිය තවමත් ගෙවා නැති අතර එය පොත්වල සටහන් කිරීමද සිදුකර නොමැත.

ඔබ විසින්,

ආ) 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීරණ ආදායම ප්‍රකාශය.

ආ) 2018 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය පිළියෙල කරන්න.

❖ **වැදගත් : සියළුම පෙර වැඩ විධිමත්ව ඉදිරිපත් කළ යුතුය.**

(ලකුණු 12)

**(මුළු ලකුණු 20)**

<u>ප්‍රශ්න අංක 03</u>

අ) පහත සඳහන් මූල්‍ය තොරතුරු සීමිත ස්මාර්ටස්ට් සමාගමේ 2018 සහ 2017 වර්ෂ සඳහා වන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙන් සහ සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශයෙන් උපුටාගත් තොරතුරු වේ.

**සීමිත ස්මාර්ටස්ට් සමාගම 2017 මාර්තු 31 දිනට හා**

**2018 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

රු. 000

| | 31/03/2018 | 31/03/2017 |
|---|---|---|
| **වත්කම්** | | |
| **ස්ථාවර වත්කම්** | | |
| යන්ත්‍ර හා උපකරණ | 27,310 | 28,800 |
| | **27,310** | **28,800** |
| | | |
| **ජංගම වත්කම්** | | |
| මුදල් | 840 | 980 |
| ණයගැතියෝ | 1,650 | 1,880 |
| තොගය | 3,930 | 4,220 |
| | **6,420** | **7,080** |
| | | |
| **එකතුව** | **33,730** | **35,880** |
| | | |
| **වගකීම් හා හිමිකම් ප්‍රාග්ධනය** | | |
| **හිමිකම් ප්‍රාග්ධනය** | | |
| සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | 5,000 | 5,500 |
| රඳවාගත් ඉපැයුම් | 17,990 | 20,410 |
| | | |
| දිගුකාලීන ණය | 5,310 | 4,570 |

| | | |
|---|---|---|
| | **28,300** | **30,480** |
| | | |
| | | |
| ජංගම වගකීම් | 5,430 | 5,400 |
| ණය හිමියෝ | **5,430** | **5,400** |
| | | |
| **එකතුව** | **33,730** | **35,880** |

**සීමිත ස්මාර්ටස්ට් සමාගම**

**2017 හා 2018 මාර්තු 31 න් අවසන් වර්ෂ සඳහා ආදායම් ප්‍රකාශය**

රු. 000

| | **2018** | **2017** |
|---|---|---|
| | | |
| විකුණුම් | 2,112 | 2,311 |
| විකුණුම් බඩුවල පිරිවැය | (1,205) | (1,344) |
| දළ ලාභය | **907** | **967** |
| මෙහෙයුම් වියදම් | (407) | (417) |
| බදුපෙර ලාභය | **500** | **550** |
| බදු (30%) | (150) | (165) |
| **ශුද්ධ ලාභය** | **350** | **385** |

2018 වසර අවසානයේදී පැවති සාමාන්‍ය කොටස් සංඛ්‍යාව 35,000 ක් බවත්, සාමාන්‍ය කොටසක වෙළඳපල මිල රු. 35/= ක් බවත් සලකන්න.

2018 වර්ෂය සඳහා සීමිත් ස්මාර්ටස්ට් සමාගම සඳහා පහත අනුපාතයන් ගණනය කරන්න.

i. ජංගම අනුපාතය

ii. ක්ෂණික වත්කම් අනුපාතය

iii. ශුද්ධ ලාභ අනුපාතය

iv. යොදවූ ප්‍රාග්ධනය සඳහා ඉපැයුම් (ROCE)

v. කොටසක ඉපයුම් (EPS)

vi. මිල ඉපයුම් අනුපාතය

(ලකුණු 12)

ආ) සී/සු අමරේ සමාගම මහා පරිමාණ දුව භාණ්ඩ නිෂ්පාදන ආයතනයක් වේ. 2018/03/31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති අතර පහත සඳහන් සිද්ධීන් සැලකිල්ලට ගත යුතුව ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇත්තේ 2018 ජූලි මස 01 වන දිනය.

(i) 2017.12.10 දින අමරේ සමාගමේ කර්මාන්තශාලාවේ කොටසකට ගින්නෙන් සිදුවූ අලාභය සඳහා ඉල්ලුම් කරන ලද වන්දිය වෙනුවෙන් රු. 500,000 ක ගෙවීමක් 2018/04/10 දින අදාල රක්ෂණ සමාගම විසින් ලබාදෙන ලදී.

(ii) අමරේ සමාගම සතුව පවතින විශේෂිත යන්ත්‍රයක ශේෂය 2017/04/01 දිනට රු. 1,600,000/- කි. එදිනට ක්ෂය සඳහා වෙන්කිරීම රු. 400,000/- ක් වන අතර ක්ෂය අනුපාතය වාර්ෂිකව සරල මාර්ග ක්‍රමයට 12.5% කි. යන්ත්‍රයේ පැවැත්ම පිළිබඳව කළ ඇගයීමකදී යන්ත්‍රය තවදුරටත් පාවිච්චි කලහැකි කාලය උපරිම වශයෙන් වර්ෂ 4 ක් පමණක් බව තහවුරු විය.

(iii) අමරේ සමාගම විසින් 2017/03/31 දිනට පෙර විකුණන ලද රු. 165,000 ක් වටිනා භාණ්ඩ 2017/03/31 දිනට වූ අවසන් තොගයෙහි වැරදි ලෙස ලෙස ඇතුලත් කර තිබූ බව 2018/03/31 දිනට කරනු ලැබූ තොග ඇගයීමේදී අනාවරණය විය.

(අ) ඉහත (i), (ii), සහ (iii) යන සිද්ධීන් සඳහා අදාල කරගත යුතු ගිණුම් ප්‍රමිතයන් දක්වා 2018/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කරන මූල්‍ය ප්‍රකාශන වලට මෙම සිද්ධීන් අදාල වන ආකාරය පැහැදිලි කරන්න.

(ආ) අමරේ සමාගමේ විශේෂිත යන්ත්‍රයේ (ii) කොටස 2018/03/31 දිනට අදාල ක්ෂය ප්‍රමාණය ගණනය කර දක්වන්න.

(ලකුණු 13)

(මුළු ලකුණු 25)